| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| 10 **ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව - I** |

නම/ විභාග අංකයඃ ……………………………………  කාලය පැය 1 යි

**සැලකිය යුතුයි.**

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය.
- එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

★ **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01)ජලය, වායුව හා …………………… එකතු වීමෙන් ජෛවගෝලයේ ජෛව පරිසරය නිර්මාණය වේ. (වනාන්තර/ පස/ ඛනිජ)

02)ප්‍රභාසංස්ලේෂණය සඳහා ……………………………… වායුව අවශ්‍ය වේ. (කාබන්ඩයොක්සයිඩ්/ ඔක්සිජන්/ නයිට්‍රජන්)

03)ටිටිකාකා විල ……………………………… මහද්වීපයේ පිහිටා ඇත. (උතුරු ඇමරිකා/ දකුණු ඇමරිකා/ අප්‍රිකා)

04)ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උයන …………………………. පිහිටා ඇත. (බතලේගොඩ/ ගන්නෝරුව/ මහඉලුප්පල්ලම)

05)ආසියා මහද්වීපික තටකය තුළ ……………………………….. පිහිටා ඇත. (මැඩගස්කරය/ තස්මේනියාව/ බෝර්නියෝ)

06)ලෝක ජනගහනයෙන් බහුතරයක් ………………………… ප්‍රධාන ආහාරය ලෙස භාවිතා කරයි. (සහල්/ ඉරිඟු/ තිරිඟු)

07)ශ්‍රී ලංකාවේ වැඩිම බිම ප්‍රමාණයක වී වගා කරනු ලබන්නේ …………………………………. දිස්ත්‍රික්කයේ ය. (පොළොන්නරුව/ කුරුණෑගල/ අනුරාධපුරය)

08)ලෝකයේ ………………………………. කලාපීය ප්‍රදේශවල කිරි පට්ටි පාලනය වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත. (නිවර්තන/ සෞම්‍ය/ සීත)

09)ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය …………………………. කි. (100m/ 20m/ 40m)

10)භූමියේ මතුපිට කිලෝමීටර් එකක දුර ශ්‍රී ලංකා 1:50 000 සිතියම්වල දක්වෙන්නේ ………………………….. කිනි. (2cm/ 1cm/ 0.5cm)

★ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

11)ශ්‍රී ලංකාවේ තේ මිලදී ගන්නා ප්‍රධාන කලාපය මැදපෙරදිග කලාපයයි. (නි/ වැ)

12)බෝල්ටික් මුහුද අර්ධ වශයෙන් ගොඩබිම්වලින් වට වූ මුහුදකි. (නි/ වැ)

13)කෙපන් යනු ලෝක මට්ටමින් දේශගුණ වර්ගීකරණයක් ඉදිරිපත් කළ පුද්ගලයෙකි. (නි/ වැ)

14)සුවිශේෂ කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇති සිතියම් හු ලක්ෂණ සිතියම් නම් වේ. (නි/ වැ)

15)ලොම් ලැටරයිට් පස රබර් වගාවට ඉතා යෝග්‍යය. (නි/ වැ)

★ **අංක 16 සිට 25 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16)දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය තත්ත්වය ................................... නම් වේ.

17)බෑවුම් සහිත ප්‍රදේශවල වී ගොවිතැන ............................................. ක්‍රමයට සිදුකරයි.

18)රබර් පර්යේෂණ ආයතනය ......................................... පිහිටා ඇත.

19)මින්ඩනාඕ ආගාධය ...................................... සාගරයේ පිහිටා ඇත.

20)දැනට ලොව හමුවී ඇති පැරණිතම සිතියම ............................................. ජාතිකයෙකු විසින් මැටි පුවරුවක අඳින ලද්දකි.

21)හවායි දූපත් නිර්මාණය වී ඇත්තේ ගැඹුරු සාගරයේ .................................... ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස ය.

★ **ප්‍රශ්න අංක 22 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති වගුව උපයෝගී කරගන්න.**

| වර්ෂය | වී වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් දහස් | වී නිෂ්පාදනය ප්‍රමාණය මෙට්‍රික් ටොන් දහස් |
|---|---|---|
| 2008 | 1053 | 3875 |
| 2009 | 978 | 3652 |
| 2010 | 1065 | 4301 |
| 2011 | 1223 | 3894 |
| 2012 | 1067 | 3846 |

22)වැඩිම වී නිෂ්පාදන ප්‍රමාණය වාර්තා වන්නේ ............................ වර්ෂයේදී ය.

23)වැඩිම බිම් ප්‍රමාණයක් වී වගා කර ඇත්තේ ...................... වර්ෂයේදී ය.

24)අඩුම බිම් ප්‍රමාණයක වී වගා කර ඇත්තේ ........................... වර්ෂයේදී ය.

25)අඩුම වී නිෂ්පාදන ප්‍රමාණය වාර්තා වන්නේ ........................... වර්ෂයේදී ය.

★ **අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල "අ" හා "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාවය අනුව ගැළපූ වට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.**

26) ලෝකයේ ප්‍රධාන කඳුවැටි කිහිපයක් "අ" තීරුවේ ද ඒවා පිහිට මහද්වීප "ආ" තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව "ආ" ගළපා පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. ඇපලේචියන් | A) අප්‍රිකා මහද්වීපය |
| 2. ඇල්ප්ස් | B) උතුරු ඇමරිකා මහද්වීපය |
| 3. ඩ්‍රැකන්ස්බර්ග් | C) යුරෝපා මහද්වීපය |
| | D) දකුණු ඇමරිකා මහද්වීපය |

1) B C D 2) B C A 3) D C A 4) A C D

(……….)

27) ශ්‍රී ලංකාවේ වී පර්යේෂණ ආයතන කිහිපයක් "අ" තීරුවේද ඒවා පිහිටා ඇති දිස්ත්‍රික්ක "ආ" තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගළපා පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | ආ |
|---|---|
| 1. බෝඹුවල | A) හම්බන්තොට |
| 2. අම්බලන්තොට | B) අනුරාධපුරය |
| 3. මහඉලුප්පල්ලම | C) පොළොන්නරුව |
| | D) කළුතර |

1) A C B 2) D B A 3) D A B 4) D A C

(……….)

28) ප්‍රධාන මුහුදු වර්ග තුනක් "අ" තීරුවේ ද ඒ සඳහා උදහරණ කිහිපයක් "ආ" තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගළපා පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | ආ |
|---|---|
| 1. සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වට වූ මුහුදු | A) එරල් මුහුද |
| 2. අර්ධ වශයෙන් ගොඩබිමෙන් වට වූ මුහුද | B) කහ මුහුද |
| 3. සාගරයට සම්බන්ධ සාගරයේ ම පිහිටි මුහුදු | C) රතු මුහුද |
| | D) අරාබි මුහුද |

1) B C D 2) A C D 3) C A D 4) D C B

(……….)

29) පෘථිවි වායුගෝලයේ පවතින වායු වර්ග කිහිපයක් "අ" තීරුවේ ද පරිමාව ප්‍රතිශතයක් ලෙස "ආ" තීරුවේ ද දක්වා ඇත. ඒවා නිවැරදිව ගළපා පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | ආ |
|---|---|
| 1) කාබන්ඩයොක්සයිඩ් | A) 20.5 |
| 2) ඔක්සිජන් | B) 78.09 |
| 3) නයිට්‍රජන් | C) 0.03 |
| | D) 11.5 |

1) C A B 2) C B D 3) A B C 4) D C A

(……….)

30) ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික බෝග තුනක් "අ" තීරුවේ ද ඒ සඳහා අවශ්‍ය වන වර්ෂාපතන ප්‍රමාණයන් "ආ" තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගළපා පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

| අ | ආ |
|---|---|
| 1) වී | A) 300mm - 500mm |
| 2) තිරිඟු | B) 1900mm - 5460mm |
| 3) තේ | C) 2000mm - 2500mm |
| | D) 2000 mm පමණ |

1) C A B 2) D C B 3) D A B 4) A D B

(……….)

31) කජු හා මිරිස් භෝග සඳහා වූ අපනයන ගම්මාන දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.

1) දඹදෙණිය, කටුගම්පොල
2) රාජාංගනය, බිංගදෙණිය
3) දඹදෙණිය, රාජාංගනය
4) ගන්නෝරුව, බටඅත

(……….)

32) ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයක් වන පෝ ගංගා නිම්නය පිහිටා ඇති රට මින් කුමක්ද?

1) ප්‍රංශය
2) ජර්මනිය
3) ග්‍රීසිය
4) ඉතාලිය

(……….)

33) ඕසෝන් වායු ස්ථරය පිහිටා ඇත්තේ

1) මෙසෝ ගෝලය තුළ ය
2) පරිවර්ති ගෝලය තුළ ය
3) තාප ගෝලය තුළ ය
4) අපරිවර්ති ගෝලය තුළ ය

(……….)

34) තල්ලබාර් තැන්න පිහිටා ඇති රට වන්නේ

1) ඇමරිකා එක්සත් ජනපදය
2) චීනය
3) ඕස්ට්‍රේලියාව
4) බ්‍රසීලය

(……….)

35) තෝරින් - 10 යනු

1) ඉරිඟු විශේෂයකි
2) වී ප්‍රභේදයකි
3) බාර්ලි විශේෂයකි
4) තිරිඟු විශේෂයකි

(……….)

36) භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන පහත තොරතුරු අතරින් භෞතික ලක්ෂණ අඩංගු පිළිතුර තෝරන්න.

1) වැව, ගංගාව, වාරිමාර්ග ඇළ
2) වී වගාව, හේන, ගෙවතු
3) පාසල, රෝහල, පොලීසිය
4) අඩිපාර, කරත්ත පාර, වැව

(……….)

37) ලෝකයේ විශාලම මිරිදිය විල වන්නේ මින් කුමක්ද?

1) බයිකල් විල
2) සුපීරියර් විල
3) වික්ටෝරියා විල
4) අයර් විල

(……….)

38) වී වගාව සඳහා අවශ්‍ය භෞතික සාධකයක් වන්නේ මින් කුමක්ද?

1) ශ්‍රමය
2) මද බෑවුම් සහිත බිම
3) දියලු පස
4) $15℃ - 27℃$ අතර උෂ්ණත්වය

(……….)

★ **අංක 39, 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.**

A) අස්වැන්න
B) කෘමිනාශක භාවිතය
C) යෙදවුම්වල මිල
D) ජෛව විවිධත්වය
E) පොහොර භාවිතය

39) ඉහත එක් සාධකයක වැඩි වීම තවත් සාධකයක වැඩි වීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

1) C හා A
2) E හා A
3) B හා D
4) A හා B

40) ඉහත එක් සාධකයක වැඩි වීම තවත් සාධකයක අඩු වීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ

1) A හා C
2) E හා C
3) B හා D
4) D හා A